www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පලාත් පාලන ඡන්ද ප්‍රතිඵල යුද්ධය පිලිබඳව පුලුල්ව පැතිරුනු බිය පිලිබිඹු කරයි

## Local election results in Sri Lanka reflect widespread fears of war

**සරත් කුමාර විසිනි**
**2006 මැයි 29**

තීරනාත්මක ජයක් අත්පත් කර ගැනීමේ විශාල උද්ඝෝෂනයක් පැවතියේ වුව ද, මැයි 20 වන දා පැවැත්වුන ශ්‍රී ලංකාවේ පලාත් පාලන මැතිවරනයේ අවසාන වටයේ ප්‍රතිඵලය පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) වැදුන පහරක් බව පෙනේ. මැතිවරනය පැවැත්වුන ප්‍රාදේශීය සභා 20න් එජනිසය ජය ගැනීමට සමත් වූයේ පහක් පමනක් වන අතර, සියල්ලට මත් වඩා ඉමහත් වැදගත්කමක් උසුලන කොලඹ නගර සභාව දිනා ගැනීමට ඔවුහු අසමත් වූහ.

බොහෝ ප්‍රාදේශීය සභාවන් මාර්තු 30 වන දා තෝරා පත් කර ගැනින. කෙසේ වෙතත්, කොලඹ ඇතුලු ප්‍රදේශ 18ක නඩුහබ හේතුවෙන් ද නැගෙනහිරදිග මඩකලපුවේ සභා දෙකක ආරක්ෂක හේතු නිසා ද ඡන්දය පැවැත්වීම කල් තැබින. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) විසින් පාලනය කරනු ලබන උතුරුදිග වන්නි ප්‍රදේශයේ සභා දෙකක මැතිවරනය දින නියමයක් නොමැතිව කල් තැබින.

ඡන්දයේ පලමු වටයේ දී එජනිසය සභා 266න් 233ක් අත් කර ගනිමින් කැපී පෙනෙන ජයග්‍රහනයක් ලබා ගත්තේ ය. එම ඡන්දය පැවතියේ, සාමය සොයා යන්නේ ය යන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ කියා පෑම්වලට යම් වැදගත්කමක් ලබා දෙමින් ආන්ඩුව හා එල්ටීටීඊය අතර පෙබරවාරියේ දී අලුතින් සාකච්ඡා ඇරඹීමේ මුවවිටේ දී ය. එසේ ම එජනිසය, තමන්ට සහාය දෙන සභාවන්ට හොඳින් සලකන බවට පොරොන්දු දීම පිනිස තමන් ජාතික මට්ටමෙන් බලයේ සිටීම භාවිත කලේ ය.

කෙසේ වෙතත් මෑත ඡන්දය පැවැත්වූයේ යුද්ධයේ සෙවනැල්ල තුල ය. ආන්ඩුවට හිතපක්ෂ පැරා-මිලිටරි කන්ඩායම්වල ක්‍රියාවන් වීමට බොහෝ සෙයින් ඉඩ ඇති අමු ප්‍රකෝපකරනයන් මාලාවක් මගින් ආතතීන් අවුලුවනු ලැබූ අතර එය ප්‍රචන්ඩත්වයේ ඉහල වටයකට මග පෑදී ය. ප්‍රමුඛ පෙල එල්ටීටීඊ-හිතවාදී දේශපාලනඥයෙකු වූ වී. විග්නේශ්වරම් අප්‍රේල් 7 දා ත්‍රිකුනාමලයේ දී වෙඩි තබා මරා දමින. සාම කතාවල දෙවන වටයේ සැලසුම් බිඳ වැටුන අතර කොලඹ හමුදා මූලස්ථානයේ දී හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකාගේ දිවි යම්තමින් ගැලවුන මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව අප්‍රේල් 25 දා විවෘත ගැටුම පුපුරා ගියේ ය.

මැයි 20 පලාත් පාලන මැතිවරනයේ දී ඡන්ද ප්‍රකාශ වීම පහත වැටීම හා එජනිසයෙන් ඉවතට ගමන් කිරීම යුද්ධයට යලි පිවිසීම පිලිබඳව පුලුල්ව පවතින බිය මෙන් ම තියුනු ලෙස ඉහල යන ජීවන වියදම පිලිබඳව පවතින කෝපය ද පිලිබිඹු කරයි. කලකිරීම පවතිනුයේ සරලව එජනිසය කෙරේ පමනක් නො ව, එලෙසට ම, ප්‍රධාන විරුද්ධ පක්ෂ කෙරේ ද වෙයි. මීට පෙර සාම කතාවල ශූරයන් ලෙස පෙරෙට්ටුවේ ගිය එක්සත් ජාතික පක්ෂය (එජාප) ආන්ඩුවේ ආක්‍රමනශීලී පිලිවෙත සමග වේගයෙන් පෙල ගැසෙමින් සිටී.

බොහෝ සභාවල ඡන්ද ප්‍රකාශ කිරීමේ අනුපාතය සියයට 55 සහ 62 අතර ප්‍රමානයකින් පහල වැටුනි. කොලඹ නගර සභාවේ සංඛ්‍යාව හුදු සියයට 54.29ක්ව, අඩු ම ඒවායින් එකක් බවට පත් විය. මේවා පසු ගිය නොවැම්බරයේ ජනාධිපතිවරනයේ ජාතික සාමාන්‍යයේ සියයට 75 හා මාර්තුවේ පලාත් පාලන මැතිවරනයේ පලමු වටයේ සියයට 65 සමග සැසඳිය යුතු ය.

ඡන්දය භාවිත කිරීම කැපී පෙනෙන ලෙසට ඉහල පැවතුනේ යුද්ධයෙන් පෙලෙන නැගෙනහිර පලාතේ පමනකි. එහෙත් එම ඡන්දදායකයන් ප්‍රධාන පක්ෂවලට පසුපස හරවා වාර්ගික පක්ෂවලට හා ස්වාධීන කන්ඩායම්වලට සහාය දුන්හ. ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය (ශ්‍රීලමුකො) සාම ක්‍රියාවලියට යලි අවතීර්න වීම හා 2004 දෙසැම්බර් සුනාමි ව්‍යසනයේ දිවි ගලවා ගත් අයට උදව් කිරීම ඉල්ලා සිටිමින් නැගෙනහිර ප්‍රාදේශීය සභා අටෙන් හයක් දිනා ගත්තේ ය. ඉලංගෙයි තමිල් අරසු කච්චි (අයිටීඒකේ) ලෙස තරග වැදුන එල්ටීටීඊ-හිතවාදී දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) නවින්දන්වෙලි ප්‍රාදේශීය සභාව දිනා ගත්තේ ය.

රටේ දේශපාලන කටයුතුවල දී මහ නගර සභාව ඓතිහාසිකව වැදගත් භූමිකාවක් ඉටු කලා වූ කොලඹ අගනුවර, අවධානයේ ප්‍රධාන නාභියව තිබින. පක්ෂ

හා ස්වාධීන කණ්ඩායම් 12ක් ඡන්දයේ දී තරග වැදුනි. යූඇන්පියේ පිටුබලය ලද පෙර අසා නොතිබුන ස්වාධීන කණ්ඩායමක් විසින් එජනිසය තීරනාත්මකව පරදවනු ලැබී ය. එම කණ්ඩායම, එජනිසය ලද හුදු ඡන්ද 57,158ට සංසන්දනාත්මකව, ඡන්ද 82,580ක් ලැබුවේ ය.

රාජපක්ෂට කොලඹ ජයග්‍රහනය පිලිබඳව ඉමහත් බලාපොරොත්තු තිබින. ඔහුට අවශ්‍ය වූයේ එජාප පාලනය අවසන් කර දැමීම පමනක් නො ව අගනුවර සිංහල, දෙමල හා මුස්ලිම් ඡන්දදායකයන්ගේ ඒ ඒ සැලකිය යුතු කණ්ඩායම්වලින් වාර්ගික රේඛා ඔස්සේ තමන්ට ජය ගැනීමට ඇති හැකියාව පෙන්නුම් කිරීම ද විය.

රාජපක්ෂ දිගු කාලීන රැඩිකල් අවස්ථාවාදියෙකු වූ වාසුදේව නානායක්කාර එජනිස ලැයිස්තුවට නායකත්වය දෙන්නා වූ පුරපති අපේක්ෂකයා ලෙස තෝරා ගත්තේ ය. ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනේ (ප්‍රවාපෙ) නායකයා වන නානායක්කාර මහ බලවතුන් හා ව්‍යාපාරිකයන් විසින් පෙරට දමනු ලබන ඊනියා සාම ක්‍රියාවලියට සහාය දෙන්නෙකි. යුද විරෝධී භාවයන් සේ ම කසල එකතු කිරීමේ සේවාවන් බිඳ වැටීමෙන් ප්‍රකට වූ නගරයේ ගරා වැටෙන යටිතල පහසුකම් පිලිබඳව වන කෝපය ද ගසා කෑමට රාජපක්ෂ බලාපොරොත්තු විය. රාජපක්ෂ සහ නානායක්කාර වසර කීපයක් තුල කොලඹ නවීන නගරයක් බවට පරිවර්තනය කිරීමට පොරොන්දු විය.

තාක්ෂනික දුබලතා මත එජාප ලැයිස්තුව ප්‍රතික්ෂේප කිරීමට මැතිවරන කොමසාරිස්වරයා ගත් තීන්දුව නානායක්කාරගේ අවස්ථාවන් තවත් ඉහල නැංවී ය. කෙසේ වෙතත් ඡන්ද සෝදාපාලුවට ලක් වූ එජනිසයට මේ කිසිවකින් උදව්වක් නොලැබුනේ ය. එජාප පිටුබලය ලද ස්වාධීන කණ්ඩායම ලද ආසන 23ට සංසන්දනාත්මකව ඔවුන්ට ලැබුනේ ආසන 14ක් පමනි.

"අපට දෙමල ජාතිකයන්ගෙන් හා මුස්ලිම්වරුන්ගෙන් වැඩිපුර ඡන්ද ලබා ගැනීමට නොහැකි වූ අතර සිංහල ඡන්දවලින් ද (අපේ) ඡන්ද වැඩි කර ගැනීමට නොහැකි විය. එයට හේතු වූයේ යුද්ධය නැවත ඇති වීම පිලිබඳ බිය මෙන් ම ජීවන වියදම් බර ය" යනුවෙන් පසුව දා නානායක්කාර සිරස රූපවාහිනිය තුලින් පිලිගත්තේ ය.

ඩේලි මිරර් පුවත්පතට අනුව, පසු ගිය සතියේ මැතිවරනය පිලිබඳව වූ පශ්චාත් පරීක්ෂනයක දී රාජපක්ෂ පක්ෂයේ දුර්වල තත්වය පිලිබඳව 'කනස්සල්ල' ප්‍රකාශ කලේ ය. එහෙත් ඔහු නානායක්කාරගේ සඳහන් කිරීම් ඉවත දමමින්, ඒ වෙනුවට ප්‍රතිඵලයේ දෝෂාරෝපනය පක්ෂ සංවිධායකවරුන්ගේ සහයෝගයේ මඳකම මත පටවමින් සිය 'ප්‍රථම පරාජය' ගසාබසා දැම්මේ ය.

එජාපය කොලඹ ප්‍රතිඵලය ජයග්‍රහනයක් සේ කියා පෑවත් එය එවැන්නක් නො වේ. එජාප පිටුබලය ලද ස්වාධීන කණ්ඩායම ලැබුවේ ලියාපදිංචි ඡන්දදායකත්වයෙන් සියයට 21ක් පමනක් වන අතර ඉන් බොහොමයක් එජාපයට දෙන ක්‍රියාශීලී සහායකට වඩා එජනිසයට වන විරෝධය නියෝජනය කලේ ය. දෙමල ව්‍යාපාරිකයෙකු වන රාජේන්ද්‍රන් නායකත්වය දෙන ස්වාධීන කණ්ඩායම නගරාධිපති හා අන් නිලධාරීන් පත් කරනු ඇති නමුදු ඔවුන්ට ආසන 53ක් සහිත සභාවේ බහුතරයක් නැත.

කොලඹ මහ නගර සභාවේ ඉහල තනතුරු ලැබෙනු ඇත්තේ කාට ද යන්න දැකිය හැකි වනු ඇත්තේ ඉදිරියේ දී ය. එජාපයට සහයෝගය දීමේ ගනුදෙනුවේ කොටසක් ලෙස ස්වාධීන සභිකයන් එජාප සාමාජිකයන්ට ආසන ලැබෙන අයුරු ඉවත් වීමට එකඟ වී ඇතැයි විශ්වාස කරනු ලැබේ. දිගු කාලීන එජාප පතාකයෙකු වන සිරිසේන කුරේ නගරාධිපති ලෙස කණ්ඩායම විසින් නම් කරනු ලැබේ. කෙසේ වෙතත් බොහෝ ස්වාධීන සභිකයෝ ඉල්ලා අස් වීමට කරන එජාප වෑයමට ප්‍රතිරෝධය දක්වති.

නොවැම්බරයේ ජනාධිපතිවරනයෙන් පරාජය වී පලාත් පාලන මැතිවරනයේ ප්‍රථම වටයේ දී විශාල වසයෙන් පල්ලම් බැස්ස එජාපය සිය දේශපාලන වාසනාවට නව ජීවනය ලැබ තිබේ ය යන්නට සාධකයක් ලෙස කොලඹ ප්‍රතිඵල මත එල්ලී සිටී. ඔවුන් කොලඹ අසල ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් වන ගම්පහ මහ නගර සභාව ද ජය ගත් නමුත් දකුනුදිග ප්‍රධාන නගරය වන ගාල්ල එජනිසයට පරාද විය. එජනිසය හා එජාපය ග්‍රාමීය ප්‍රදේශවල සාපේක්ෂව කුඩා සභා තුන බැගින් දිනා ගත්තේ ය.

ආන්ඩුවේ සිංහල ස්වෝත්තමවාදී සගයා වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) කිසිදු සභාවක් දිනා ගැනීමට අසමත් වීම තීරනාත්මක ය. මාර්තු වටයේ දී ඔවුන්ට දිනා ගත හැකි වූයේ එකක් පමනි. වර්ගවාදී දේශපාලනයේ හා ග්‍රාමීය ජනප්‍රියවාදයේ මිශ්‍රනයක් මත පදනම් වන ජවිපෙ එල්ටීටීඊයට විරුද්ධව යුද්ධය වෙනුවෙන් උද්ඝෝෂනය කරමින් සිටී. කොලඹ දී ඔවුන්ගේ ඡන්ද ප්‍රමානය 2002 ඡන්දයට සංසන්දනාත්මකව තුනෙන් පංගුවකින් කඩා වැටුනි. ඔවුන් ගම්පහ දී වලංගු ඡන්දවලින් සියයට 24ක් ලද නමුත් ජවිපෙ දකුනු බලකොටුවේ කොටසක් ලෙස සැලකෙන ගාල්ලේ දී ලැබුවේ සියයට 6.6ක් පමනි.

රාජපක්ෂගේ අනෙක් වර්ගවාදී සගයා දක්ෂිනාංශික ජාතික හෙල උරුමය (ජාහෙඋ) ද එතරම් ම අයහපත් තත්වයට පත් වූයේ කොලඹින් ඡන්ද 3,281ක්, ගම්පහින් 986ක්, හා ගාල්ලෙන් 353ක් ලබා ගනිමිනි. කොලඹ ප්‍රතිඵලය වැදගත් වනුයේ බෞද්ධ ධුරාවලිය, මිලිටරිය හා රාජ්‍ය මෙවලම සමග සමීප සබඳතා තිබෙන ජහෙඋ

මීට පෙර කොලඹින් මීට වඩා ඡන්ද ගෙන තිබූ හෙයිනි. ඔවුන්ට සැලකිය යුතු ඡන්ද ප්‍රමානයක් ලැබුනේ එජනිස ලැයිස්තුව ප්‍රතික්ෂේප වීම නිසා බොහෝ එජනිස ආධාරකරුවන් ජහෙඋට ඡන්දය දුන් ගම්පොල හා පාතහේවාහැට ග්‍රාමීය ප්‍රදේශයන්ගෙනි.

පලාත් පාලන මැතිවරනයේ ප්‍රතිඵල, එජනිස ආන්ඩුව ජීවන තත්වයන්ට එල්ල කර ගෙන යන ප්‍රහාරයන් සහ යුද්ධය දිශාවට යොමු වීම පිලිබඳ ගැඹුරු අතෘප්තිය විකෘති ආකාරයකට එලිමහනට ගෙන එයි. රාජපක්ෂ සිය පිලිවෙත් යලි සලකා බලනවා වෙනුවට ජවිපෙ හා ජහෙඋ පිටුබලය ඇතිව එල්ටීටීඊය පිලිබඳ සිය ආක්‍රමනශීලී පිලිවෙත දිගට ම පවත්වා ගෙන යයි. ඔහුගේ ආන්ඩුව නව දැඩි මාධ්‍ය වාරන සහ පලමු වතාවට අනිවාර්ය යුද සේවය ඇති කරන පුලුල් බලතල සහිත දේශප්‍රේමී පනතක් බල ගන්වමින් ඕනෑ ම විරුද්ධත්වයක් බිඳ දැමීම සඳහා සූදානම් වෙයි.

© www.wsws.org